# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය

## <u>විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2024/2025 අධ්‍යයන වර්ෂය</u>

### <u>ශ්‍රී පාලි මණ්ඩපය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම 2024/2025</u>

- **ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව**
- **ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව**

ඉහත සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කර ඇති **<u>විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් තොරතුරු වලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම යෝග්‍යතා පරීක්ෂණයට අයදුම් කර පෙනී සිට උසස් ප්‍රවීණත්වයක් පළ කළ යුතු ය.</u>**

**<u>ඉහත සඳහන් පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.</u>**

- **<u>යෝග්‍යතා පරීක්ෂණයට අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය</u>**

සියලුම අයදුම්කරුවන් ශ්‍රී පාලි මණ්ඩප වෙබ් අඩවිය හි (https://spc.cmb.ac.lk) ඇතුළත් අයදුම්පත්‍රය මාර්ගතව (online) සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපි ලේඛන උඩුගත (upload) කළ යුතුය.

1. පාසලේ විදුහල්පති, සමාදාන විනිසුරුවරයෙකු හෝ රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද අ.පො.ස. (උ.පෙ.) 2024 ප්‍රතිඵල ලේඛණයේ සහ අ.පො.ස. (සා.පෙ.) විභාග ප්‍රතිඵල ලේඛණයේ (ඉංග්‍රීසි විෂය සමත්) ස්කෑන් (scan) පිටපත්. <u>වෙබ් අඩවියෙන් ලබා ගන්නා ලද ප්‍රතිඵල ලේඛණ ද ඉහත පරිදි සහතික කළ යුතුයි.</u>

2. යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට අවම වශයෙන් **<u>අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි විෂය සඳහා "S" සමාර්ථයක් තිබිය යුතු ය.</u>** (විශ්වවිද්‍යාල අත් පොතෙහි සඳහන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය වන අවම සුදුසුකම් වලට අමතරව)

3. ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි දෙපසෙහිම පැහැදිලි ඡායාරූප (image).

4. අදාල මුදල ගෙවා ලබා ගත් රිසිට් පතෙහි ස්කෑන් (scan) පිටපතක්.

- **<u>යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු</u>**

ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ශ්‍රීපාලි මණ්ඩපයේ **ගිණුම් අංක 0000719939** දරන ලංකා බැංකුවේ හොරණ ශාඛාවේ ගිණුමට බැර කරන ලද මුදල් තැන්පත් පතෙහි (deposit slip) <u>ඔබගේ නම සහ හැඳුනුම්පත් අංකය පැහැදිලිව සඳහන් කර</u> ස්කෑන් (scan) පිටපතක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් අයදුම්පත්‍රය සමග උඩුගත (upload) කළ යුතුය. **<u>(ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM), චෙක්පත්, තැපැල්/ මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.)</u>**

යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් එක් උපාධි පාඨමාලාවක් වෙනුවෙන් රු: 2,000/- ක මුදලක් අය කරනු ලැබේ.

- **ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව - රු.2,000.00**
- **ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව - රු.2,000.00**

තම කැමැත්ත පරිදි යෝග්‍යතා පරීක්ෂණ එකකට හෝ දෙකටම පෙනී සිටිය හැකි අතර අයදුම් කරන එක් යෝග්‍යතා පරීක්ෂණයක් සඳහා රු.2,000 /- බැගින් ඉහත සඳහන් පරිදි ගෙවිය යුතුය.

**යෝග්‍යතා පරීක්ෂණ අයදුම්පත පිරවීම සඳහා උපදෙස් ශ්‍රී පාලි මණ්ඩප වෙබ් අඩවියෙහි ඇති "Aptitude Test – 2025 " වෙත පිවිසීමෙන් ලබා ගත හැකි** අතර යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් **ප්‍රායෝගික/වාචික පරීක්ෂණයක් ශ්‍රී පාලි මණ්ඩප පරිශ්‍රයේදී ජුනි මස පළමු සතියේ සිට පැවැත්වීමට අපේක්ෂිතය.**

- **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය**

මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (Online Application) අදාල ලියකියවිලි සමග **2025.05.22 දින ප.ව. 11.59 ට හෝ එදිනට පෙර** යොමු කළ යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මණ්ඩපාධිපති
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය
වැවල, හොරණ.

දුරකථන අංක : 034-2212919, 034-2265553
විද්‍යුත් ලිපිනය : aptitude@spc.cmb.ac.lk
නිල වෙබ් අඩවිය : https://spc.cmb.ac.lk

2025.05.05